කෙටි කතාව

# නිවී ගිය පහන් සිළ

**එදා කෑම වේල සමීරලගෙ කුස්සියේ කාලෙකින් ඉදුනෙ නැති තාලෙ එකක්. පුරුද්දක් විදියට අරක්කු නොබොන තාත්තත් සතුට වැඩි කමටද මන්ද ඇඟත් ටිකක් රත් කරගෙන හිටියෙ. තාත්ත එදා ලොක්කිව ලඟට අඬගහගෙන "ලොක්කියෙ, මේ තාත්ත ඔන්න දැන් නම් ලෙඩ වෙන්න බය නෑ. මම ලෙඩ වෙලා උඹ වැඩ කරන ආන්ඩුවෙ ඉස්පිරිතාලෙට ආවහම මේ අර 'සුජීව' මිසිගෙ තාත්තනෙ කියල මට හරි සැලකිලි තියෙයි නේද? ඇඳක් එහෙම දීල. මගෙ ලොක්කි ආණ්ඩුවෙ ඉස්පිරිතාලෙක මිසී කෙනෙක්. අපේ තරමෙ හැටියට නම් උඹ අපිට දොස්තර නෝන කෙනෙක් ගානයි දුවේ." සංතෝෂෙ, ආඩම්බරය පිරිච්ච කටහඬින් තාත්ත කියනව සමීරට මේ දැනුත් ඇහෙනවා වගෙ.**

"හත හමාරේ බස් එක ගිහිල්ලා දැන් පය භාගයකටත් වැඩියි. කඩේ ගාව ඉඳලා කොල්ලට ඔය ටික දහගමනකටත් වැඩිය එන්න වෙලානෙ. දෙයියනේ සුජීවලැ තාත්තට ලෙඩේ වැඩි වෙලාවත්ද?" සුමනාවතීට ඔය ටික හිතුනෙ කී වෙනි වතාවටද මන්ද? "චූටියේ, අයියා ටෝච් එක අරගෙනද ගියේ?. සුමනාවතී ප්‍රශ්නෙ ඇහුවෙ උත්තරයක් බලා පොරොත්තුවෙන්මත් නෙවේ. හිතට මේ නානාප්‍රකාර කල්පනාවල් එන එක එහෙමවත් නතරවෙයිද කියලා බලන්නත් එක්කයි. ටෝච් එක නැතත් පල්ලෙහා විපුල පුතාලගෙ දිහාවෙන් ඉල්ලගෙන හුලුඅත්තක් පත්තු කර ගත්ත නම් සුරුස් ගාලා එන එකනෙ. එතනත් කතාවට මැදි වෙලාද දන්නෑ. ඉන්නවනෙ ජපන් බෝනික්කියො දෙන්නා. හවස් වරුවම ඉතිං පේ වෙලා. එකියක් වත් හරි හමනට ඉගෙන ගත්තයැ. විපුලත් එක්ක තියෙන හිතවත් කමට සමීර එහෙ ආව ගියාට සුමනාවතීගෙ නම් ඒ ගැන බිංදුමාත්‍රෙක වත් කැමැත්තක් ඇත්තෙම නෑ. මේ වෙලාවෙ ඔලුවට වැටුන ඒ කල්පනාවෙන් සුමනාවතී තවත් නොසන්සුන් උනා.

"චූටියෙ අට හමාරත් වෙලානෙ. පත්තු කරලා ගනින් ඔය හුලු අත්තක්. අපි දෙන්නා ටිකක් රබර් ඉස්ටෝරුව කිට්ටුවටවත් යන්න. සුමනාවතීට නම් දැන් හිතට දැනෙන්නේ වචනයෙන් කියන්න බැරි බයක්. දෙයියනේ මහ මනුස්සයටත් මොනව හරි වෙයිද? සුමනාවතීගේ පපුව හිර කරනවා වාගෙ ". නෑ නෑ එහෙම නැතුව ඇති. අද දවාලෙත් බත් කටවල් දෙකක් කෑවනේ. එක්ක යනවට වැඩිය කොච්චර ගුනද? හෙට අනිද්දා විතර ලෙඩාව ගෙදර ගෙනියන්නත් පුළුවන් වෙයි කියලනෙ වාට්ටුවෙ දොස්තර මහත්තයා කීවේ. සුමනාවතීගෙ උඩු හිතේ සිතිවිලි වලින් යටි හිතට නැගුන අනියත බිය යටපත් කරලා දැම්මා.

"අම්මේ, මෙන්න අයියා ආවා.." පිලිකන්න පැත්තෙන් හුලු අත්තක් අරගෙන ආපු සුරම්‍ය එහෙම කියනකොට සුමනාවතී හිටියෙ ඉස්තෝප්පුවෙ යතුර දමමින්. "හත හමාරේ බස් එක ගිහිල්ලා කොච්චර වෙලාද? තාත්තට වෙනසක් එහෙම නෑ නේද? එළියවත් නැතුව මේ කළුවරේ උඹ කොහොමද ආවේ පුතේ ?" සුමනාවතීගෙන් සමීරට එකදිගටම ප්‍රශ්න වැලක්. සමීර ඒ එකකටවත් පිළිතුරු දෙන්න මග නතර නොවී ගේ ඇතුලටම ගියා. "චූටියෙ වතුර එකක් ගෙනත් දියං නංගියේ, හරිම මහන්සියි" කියාගෙන.

"දැක දැකම බස් එක මග ඇරුන. පොලීසිය හන්දියෙන් බැහැල පයින් එනකොට රබර් වත්තේ ලොරියෙ සුමනෙ මාමා මාව ඒකෙ දාගෙන ඇවිල්ල කඩේ ළඟින් දාලා ගියා. විපුලෙගෙ බයිසිකලේ නැගලා චන්ද්‍රරේලගේ ගේ ගාවට ඇවිල්ලා, ඒ දෙවට ඩිංග මම කළුවරේම ආවා." සමීර අම්මගෙ ප්‍රශ්න දෙකටම එකපාර පිළිතුරු දුන්නා.

"පුතේ තාත්තා රෑටත් බත් ඩිංගක් කෑවද ? සුමනාවතී තමන්ට මේ වෙලාවේ තියෙන ලොකුම ප්‍රශ්නෙ ඇහුවෙ වෙනත් ක්‍රමයකට. "මම යනකොට තාත්ත ඇඳේ හිටියෙ නෑ. තාත්ත හිටපු ඇඳේ වෙන ලෙඩෙක් හිටියෙ." දෙයියනේ එතකොට ? සුමනාවතීට උන් හිටි තැන් අමතක උනා. "මම වටපිට හොයලා බලනකොට බංකුවක් උඩ තාත්තට නින්ද ගිහිල්ලා. මම කථා කෙරුවට පස්සේ තාත්ත ඇඬුව අම්මෙ, අක්කා ගැන කියලා. ගෙදර එන්නම ඕනෙ කියලා මට වද කෙරුවා. ඒකයි මට පාරේ බස් එකට එන්නත් බැරි උනේ.

"අනේ මගේ කෙල්ල තීන්දු ගමන ගියත් හරි, මගෙ මනුස්සයට පපුවෙ අමාරුව හැදිලා ලෙඩින් වැටුනත් හරි. ආණ්ඩුවෙ ඉස්පිරිතාලෙක ඇඳන් උඩ මැරෙන්න නම් තමන්ගෙම කියලා මිසී කෙනෙක් ඉන්නම ඕන කියලා උඹලෑ තාත්තා හැමදාම කීවා. අනේ අපිට ඒ වාසනාව නැතුව ගියානේ." සුමනවතීගේ පරන තුවාලේ ආයෙමත් පෑරිලා. "පිං කාරි සසර කොට කරගෙන යන්න ගියා. ඒ හිත් වේදනාව අපේ ලගින් තියලා." සුමනාවතීගේ ඒ කතාවෙන් සමීර තද කරගෙන හිටපු කඳුලු පීල්ල උතුරන්න උනා.

සමීරට ලොක්කිව මැවිලා පේන්න පටන් ගත්තා. මැදුම් උස ඇඟ පතට අම්මගෙන් ආපු තලෙලු පාට, පිරිච්ච රවුම් මූනට තිබුන කරුනාව උතුරන ඇස් දෙක, නිතඹට දිග තිබුන කොන්ඩෙ නිතරෝම තනි කරලට ගොතල දාගෙන හිටපු ලොක්කි... තරුන කෙල්ලෙකුට තියෙන විසේට වැඩිය ලොක්කිට තිබුනෙ තලත්තෑනි ගෑනියෙකුගෙ තියෙන තැම්පත් කම. ඉස්කෝලෙ ගුරුවරයෙකුගෙන් කවදාවත් බැනුමක් අහලා නැතුව ඇති. ඉගෙන ගන්නත් පුදුම මහන්සියක් දැරුවෙ. එහෙම කෙරුවෙ තනියෙම ඔටුනු පලඳින්න හිතාගෙන නෙවේ. පවුල පිටින්ම ගොඩදාන්න බලාගෙන.

සමීරට දැනුත් ඇහෙනවා වාගේ ලොක්කි කියපු කතාව- "මල්ලියේ අම්මයි තාත්තයි මේ අනුන්ගෙ රබර් ගස් වටේට දාඩිය හලල හොයන සල්ලි වලට අපි නියම අර්ථයක් දෙන්න ඕන. ඒක එහෙම වෙන්න නම් අපි හරියට ඉගෙන ගන්න ඕන. ඊට පස්සෙ අම්මලට මුළු ජීවිත කාලයක් නොවින්ද සැප අපි එයාලට දෙන්න ඕන. මම රස්සාවක් කරන ගමන්ම මල්ලිටයි චූටියටයි දෙන්නටම හොඳට උගන්වනවා."

ඒ වගේම තමයි ලොක්කි තමන්ගෙ දුප්පත්කම හොඳට තේරුම් අරගෙන ජීවත් උන කෙල්ලක්. රබර් වත්තෙ ඉබේට වැවිලා තිබුන ගොටු කොළ කඩලා මිටි බැඳල කඩේට විකුනල තමන්ට ඕන කරන පොත් පැන්සල් ගත්තා. අම්මා, තාත්තගෙ අතේ සල්ලි නැති දවසකට හාල් සේරුවක් ගන්න පාන් ගෙඩියක් ගේන්න උනත් මේ සල්ලි දුන්නෙ කිසිම ලොභ කමක් නැතුව. කරුණාව, දයාව, තමන්ගෙ කම පිරුන හිතක් ලොක්කිට තිබුනෙ. මම, මගේ කියල හිතනවට වඩා හැම මොහොතකම අපි, අපේ කියලා තමයි ලොක්කි හිතුවෙ; වැඩ කෙරුවෙ.

සමීරට හිතෙන විදියට නම් ලොක්කි උසස් පෙළ ප්‍රතිඵල බලපු දවසටත් වඩා වැඩිපුරම සතුටු උන දවස තමයි හෙදියන් බඳවාගැනීමේ තරග විභාගයෙන් සමත් කියල දැනගත්ත දවස. එදා ලොක්කිගෙ මූණ සංතෝසෙට පිපිලා තිබුනා. "අම්මටයි, තාත්තටයි එයාලගෙ ජීවිතවල අග්ගිස්සෙදි හරි දුකක් නොවිඳ ඉන්න සලස්වන්න. මල්ලිටයි, නංගිටයි ඉහලට උගන්වල එයාලගෙ ඇස් පාදවන්න, මම හැමදාමත් දැකපු හීනෙ හැබෑ කරගන්න දැන් මට පුළුවන් වෙනව කියල මට විශ්වාසයි. අද මට කොයිතරම් සතුටු දවසක්ද?" ලොක්කි එහෙම කිව්වෙ දරා ගන්න බැරි සතුටට අඬන ගමන්.

තාත්තටයි, අම්මටයි ලොක්කිව හරියට රටක් රාජ්‍යයක් ගානයි. එදා කෑම වේල සමීරලගෙ කුස්සියේ කාලෙකින් ඉදුනෙ නැති තාලෙ එකක්. පුරුද්දක් විදියට අරක්කු නොබොන තාත්තත් සතුට වැඩි කමටද මන්ද ඇඟත් ටිකක් රත් කරගෙන හිටියෙ. තාත්ත එදා ලොක්කිව ලගට අඬගහගෙන "ලොක්කියෙ, මේ තාත්ත ඔන්න දැන් නම් ලෙඩ වෙන්න බය නෑ. මම ලෙඩ වෙලා උඹ වැඩ කරන ආන්ඩුවෙ ඉස්පිරිතාලෙට ආවහම මේ අර 'සුජීව' මිසිගෙ තාත්තනෙ කියල මට හරි සැලකිලි තියෙයි නේද? ඇඳක් එහෙම දීල. මගෙ ලොක්කි ආණ්ඩුවෙ ඉස්පිරිතාලෙක මිසී කෙනෙක්. අපේ තරමෙ හැටියට නම් උඹ අපිට දොස්තර නෝන කෙනෙක් ගානයි දුවේ." සංතෝෂෙ, ආඩම්බරය පිරිච්ච කටහඬින් තාත්ත කියනව සමීරට මේ දැනුත් ඇහෙනවා වගෙ.

රත්නපුරේ ඉස්පිරිතාලෙ හෙදි අභ්‍යාස විද්‍යාලයෙ හෙදි සිසුවියක් විදියට පුහුණු වීම පටන් ගත්ත මුල් ම මාසෙ පඩියෙන් හැමෝටම තෑගි අරගෙන ආව ලොක්කි තමයි, ඊට පස්සෙ හැමදාම සමීරගෙයි සුරම්‍යගෙයි ඉස්කෝලෙ වියදම් වලට සල්ලි දුන්නෙ. අම්මයි තාත්තයි නම් හැමදාම කීවෙ ඒ හමබවෙන දෙයක් උඹේ වියදමට තියාග නිං, පොඩි දෙන්නගෙ වැඩ අපි, අපිට පුළුවන් හැටියට කරගන්නම්" කියලයි. මුවින් නොබැන ඒ හැම දෙයක්ම අහගෙන හිටියට අම්මලා වියදම් කරනතුරු ලොක්කි බලාගෙන හිටියෙ නෑ.

සිසිරයෙදි නිද්‍රාශීලී වෙලා තිබුන ගහවැල වසන්තයෙදි මාස ගනනාවකට පස්සෙ ආයෙමත් දකින සූර්යයාට පෙමින් වෙලිල අතු ඉති දළු දාලා මල් එල දරනවා වගේ දුප්පත් කම; අඟහිඟකම නිසා යටපත් වෙලා තිබුන ලොක්කිගෙ හිතේ ආශාවන් ටිකෙන් ටික අවදිවෙලා ආපු හැටි වගේම ඒ ආශාවන් ඉෂ්ඨ කර ගන්න ලොක්කි දරපු මහන්සියත් සුළුපටු නෑ. ගෙදර දොරේ වියදම් වලට පස්සෙ අතේ ඉතුරු වෙන හැම සතයක්ම ලොක්කි




වියදම් කෙරුවෙ ගෙයක් හදාගන්න හීනෙ හැබෑ කරගන්නයි. වේයා තුඹසක් බඳිනවා වාගෙ ටිකෙන් ටික ලොක්කි ගෙයක් හදන්න බඩු එකතු කෙරුවා. ගස් ඉරවල ලෑලි හදාගත්ත. ඒත් ලොක්කි දැකපු ඒ හීනෙ නම් සමීරලට අදටත් හැබෑ නොවුන හීනයක්ම විතරයි.

අවුරුද්දෙන්, අවුරුද්ද ගෙවිලා ලොක්කිගෙ හෙදි පුහුණුව අවසාන අවුරුද්දටත් ආවා. මේ වෙනකොට සමීර සාමාන්‍ය පෙළ පාස් වෙලා උසස් පෙළට ඉගෙන ගන්නවා. සමීරට අමාරු විෂයන්ට ටියුෂන් යන්න කියලා ලොක්කි තමයි බල කරලම කීවේ. "මල්ලියේ සල්ලි ගැන හිතන්න එපා. මම කොහොම හරි කරන්නම්. ඔයා පංති යන්න. හරියට ඉගෙන ගෙන විශ්ව විද්‍යාලෙට යන්න බලන්න. අපිට ඔලුව උස්සගන්න පුළුවන් එකම ක්‍රමය තමයි ඔය පාරෙ යන එක. එහෙම කියලා තමයි ලොක්කි සමීරව උනන්දු කෙරුවෙ.

ටියුෂන් පංති යන්න පටන් ගත්තට පස්සෙ තමයි සමීර ඉස්කෝලෙට එහා පැත්තෙ තියෙන ලෝකෙ විසිතුරු දැක්කෙ. ටියුෂන් එන හැම කොල්ලෙක්ම වගේ ලස්සන හොඳ වටින ඇඳුම් අඳිනවා. හොඳ සපත්තු සෙරෙප්පු දානවා. අත් ඔරලෝසු බඳිනවා. ඔය හැම දේකටමත් වඩා සමීරගෙ හිත තදින්ම ඇදිල ගියෙ, කොල්ලන්ගෙ ආතේ නිතරෝම ගැවසෙන "මොබයිල් පොන් " එකට. ඒක නාද උන වෙලාවට තමයි තවත් උජාරුව. හරියට මොනරු වගේ ආඩම්බරේට ඔලුව උස්සල වටපිට බලල තමයි කතාව පටන් ගන්නෙත්. අනේ මටත් එකක් ගන්න පුළුවන් නම්... සමීරගෙ යොවුන් හිත වද කෙරුවෙම එහෙම කියලයි.

ලොක්කියේ මට මොබයිල් පොන් එකක් ගන්න සල්ලි දෙන්න පුළුවන්ද? සමීර ඉවසගෙන ඉඳල බැරිම තැන තමයි දවසක් ලොක්කිගෙන් එහෙම ඇහුවෙ. "අනේ මල්ලියේ එක පාරට සල්ලි ගොඩක් යටකරන්න ඕනනෙ. මේ මෑතකදි මම මහන මැෂිමකට සල්ලි බැන්දනෙ. විභාගෙ ඉවරවෙලා පත්වීම් ලැබුන ගමන්ම මම මල්ලිට සල්ලි දෙන්නම්." "තව කොයි කාලෙ කථා ද ඒවා." සමීර ගියෙ හිත රිද්දගෙන.

ඔය සිද්ධිය වෙලා සති තුනකට විතර පස්සෙ දවසක සමීර කාමරේට ගිහිල්ලා පොත් ටික මේසෙ උඩින් තියන කොට මේසෙ උඩ ලස්සන මොබයිල් පෝන එකක්. සමීරට අදහගන්නත් බෑ. "ලොක්කියේ මේක මටද? මේක මරු බඩුවක්නෙ, සෑහෙන ගානක් ඇති නේද?" ඔය වගේ දේවල් ගොඩක් කියාගෙන සමීර ලොක්කි ලගට යනකොට ලොක්කි හිටියෙ බයවෙලා වගේ. "ඇයි ලොක්කියෙ මොකද ප්‍රශ්නෙ?"

"මල්ලියෙ මේ පෝන් එක මම ඇහිඳපු එකක්. මේට්‍රන්ගෙ කාමරේ ගාව බිම වැටිලා තිබිල මම ඇහින්දෙ. හරි විදියට නම් මම අයිතිකාරයා හොයලා මේක දෙන්න ඕන. ඒත් මට මල්ලි මතක් උන නිසා මම මේක ගෙදර ගෙනාවා. මම මේ කරපු වැඩේට මගෙ හිත දොස් මට කියනවා." සමීරගෙ ප්‍රශ්නෙට ලොක්කි උත්තර දුන්නෙ එහෙම. "අනේ ලොක්කියෙ ඔයා බොරුවට බය වෙලා ඔයා හොරකම් කරල නැහැනෙ. වැටිලා තිබුන නිසා ඇහිඳගත්ත. කාගෙ ද කොහොමද කියලා අපි දන්නෙ නෑනෙ. ඔයා සද්ද නැතුව ඉන්න. මම මේක තියා ගන්නවා." සමීරගෙ තරුණ හිත පෝන් එකක් ලැබුන ප්‍රීතියට උන්මාද වෙලා තිබුන මිසක ඉදිරියෙදි සිද්ධ වෙන්න පුළුවන් අනතුරක සේයාවක් වත් දැක්කෙ නෑ. ඒත් දැන් නම් මතක් වෙන හැම වෙලාවකම හිතෙන්නෙ අනේ මම වාගේ පව්කාර මෝඩයෙක් කියලයි.

පහුවදා උදේ සමීරට ඇහැරුනෙ මොබයිල් පොන් එක නාද වෙන සද්දෙට. සමීරත් දෙපාරක් හිතන්නෙ නැතුවම දුරකථන ඇමතුමට පිලිතුරු දුන්නා. එහා පැත්තෙන් කථා කෙරුවෙ හෙද අභ්‍යාස විද්‍යාලයේ විදුහල් පතිනිය. මේ අහුලගෙන තියෙන්නෙ ලොක්කිලත් එක්ක ඉගෙන ගන්න පෝසත්ම ගෑණු ළමයගෙ මොබයිල් පොන් එක. පොන් එක නාද වෙන සද්දෙට එතනට ආපු ලොක්කි බය වෙලා සුදුමැලි වෙලා එතන හිටපු හැටි සමීරට මැවි මැවී පේනවා වාගේ.

ඔය ටෙලිෆෝන් පණිවුඩය ඇවිත් හරියටම පැය භාගයක් යන්න ඇති කඩුල්ල ගාව සද්දෙ දාලා නතර කෙරුවෙ පොලිස් ජීප් එකක්. හෙද අභ්‍යාස විද්‍යාලයේ විදුහල් පතිනියගෙ පැමිනිල්ලකට පොලීසියෙන් ඇවිත්. ඒ සද්දෙට අහල පහල උදවියත් එබි කම් කර කර බලනවා තොරතුරු අහුල ගන්න.

ලොක්කි හිටියෙ හරියට වෘක රැලකට අහුවුන මුව පොව්වෙක් වාගෙ. එතන කවුරුත් පිලිගත්තෙ නෑ ලොක්කි කියපු කතාව. පොලිසියට අරගෙන ලොක්කිව ඇප තියල නිදහස් කරගෙන ආවත් ඊට පස්සෙ ලොක්කි කිසිම කෙනෙක් එක්ක වචනයක් වත් කතා කෙරුවෙ නෑ. පිලිමයක් වගේ ඔහේ හිටිය. හුස්ම ටික වැටුන එක විතරයි වෙනසකට තිබුනෙ. කිසිම දවසක වැරැද්දක් නොකරපු ; අපහාසයට ලක් නොවිච්ච ලොක්කිට මේක මරු පහරක් උනා. සමීරට තියෙන ආදරේට ලොක්කි ඒක ගෙදර ගෙනාව බව මේ ලෝකෙ කිසිම කෙනෙකුටත් වඩා හොඳට සමීර දන්නවා. ඒකම තමයි සමීරට හිත හදාගන්න අමාරුම කාරනාව.

සමීර ඒ අවාසනාවන්ත සිදුවීම දෑහින් දැකපු වෙලාව හරියට ගලේ කොටපු අකුරක් වගේ පපුවෙ ලියවිලා තියෙන්නෙ. උදේ කාමරේට තේ එක අරගෙන ගිය චූටියගෙ කෑගැහිල්ලට සමීර කාමරේට එබිල බලන කොට ලොක්කි නහයෙන් කටෙන් සෙම පෙරාගෙන ඇඳ පාමුල වැටිල හිටියෙ. හිස් වහ කුප්පියත් එතනම තිබුනා. ඉස්පිරිතාලෙට අරගෙන යද්දි මගදිම පන ගියෙ සමීරගෙ ඔඩොක්කුවෙමයි. පවුලක් ගොඩනගන්න හිටපු දිරිය දියණියකගෙ ඉරනම ලියවිලා තිබුනෙ ඔය විදියට.

වැරදි කාරයො නිවැරදි කාරයො කොහොම උනත් පත්තු වෙලා තිබුන පහන නිවුනට පස්සෙ අඳුරු ආගාදෙ පතුලටම ආයෙමත් වැටෙන්න සමීරලගෙ පවුලෙ උදවියට සිද්ධ උනා.

ලොක්කි අමාරුවෙන් මගක් කපාපු පාර දිගේ මම මගේම වීරියෙන් ඉතුරු ටික යනවා. ඒ යන කොට ලොක්කි වගේම මම මගේ පවුලෙ අයවත් අරගෙනම ඒ ගමන යනව. ලොක්කි දැකපු හීනෙ ඒ විදියටම මල් එල ගන්වන්න මම පොරෙන්දු වෙනව ලොක්කියෙ, සමීර ලොක්කිව මතක් වෙන හැම දාකම වගේ එදත් ස්ථිර සාරෙටම හිතා ගත්ත.

*(මෙම කථාවේ වස්තු බීජය සත්‍ය සිදුවීමකි)*

සුභාෂිනී හේරත්
ඇට්වුඩ්